**තංගල්ල ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තංගල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ  අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ   ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් සභාවේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා වැයකළ රු.1,864,914 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු. 130,450 ක්වූ තොග අයිතම 13 ක් යන්ත්‍ර හා උපකරණ සහ ලිබඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | තොග අයිතම නිවැරදිව හඳුනා ගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 4,117,603 ක ස්ථාවර තැන්පතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කර්මාන්ත ණයගැති වටිනාකම රු. 2,198,931 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ණයගැතියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි වටිනාකම රු. 1,198,931 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ප්‍රතිපූර්ණය නොවූ සේවක වැටුප් වියදම් රු. 3,623,741 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ප්‍රතිපූර්ණය නොවූ වියදම් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ඉකුත් වර්ෂයේදී විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු. 146,880 ක් ලැබිය යුතු අදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ගිවිසුම්ගත නොවූ ආදායම් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත නොකළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට අදාළ එකතුව රු. 151,500 ක් වූ ගෙවිය යුතු වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | වියදම් ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලද එක්වන් මුදල් රු.666,667 ක් අදායමට නොගෙන තැන්පතුවක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉකුත් වර්ෂ වලට අදාල යතුරු කාසි මුදල් ආදායමට ගැනීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | ඉකුත් වර්ෂවල සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලද පුස්තකාල සාමාජික ගාස්තු රු.392,480 ක් ආදායමට නොගෙන තැන්පතුවක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු සේවක ණය රු. 64,927 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | වැඩිපුර අය කරන ලද මුදල ආපසු ගෙවීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නෙසැසඳු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු. 1,816,013 ක වෙනසක් විය. | වෙනස හඳුනාගෙන නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු. 123,347,143 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2018 වර්ෂයේ සිට හඳුනා ගන්නා ලද වත්කම් වලට පමණක් උපලේඛනයක් සකස් කර ඇති බව හා ස්ථාවර තැන්පත් සහතිකයක් නොමැති බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | සභාව විසින් හඳුනාගත් දියුණු කළ ප්‍රදේශ වලින් වරිපනම් බදු අය කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | වරිපනම් ඒකක 1000 ක් හඳුනාගත් අතර ඉතිරි වරිපනම් දේපළද හඳුනාගෙන තක්සේරු කර ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය රීති 218 | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් සමීක්ෂණ මණ්ඩලයක් ලවා පරීක්ෂා කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී එපරිදි කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන ලිපියේ 06 වන ඡේදය | නව වීථි ලාම්පු ස්ථාපිත කිරීමේදී විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් අනුමැතිය නොලත් වීථි පහන් 3221 ක් සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය නොලත් වීථි පහන් සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 25,507,935 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 64,617,857 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 775,000 | 1,139,984 | 1,343,406 | 829,075 | 6,020,000 | 1,433,484 | 877,946 | 1,032,497 |
| කුලී | 9,318,730 | 10,158,765 | 11,691,071 | 1,740,742 | 7,780,700 | 7,603,305 | 5,914,359 | 3,273,048 |
| බලපත්‍ර ගාස්තු | 6,735,000 | 3,871,426 | 3,925,401 | 530,525 | 2,561,000 | 1,945,691 | 2,393,629 | 584,500 |
| වෙනත් ආදායම් | 2,172,180 | 4,789,508 | 5,112,378 | 365,500 | - | 2,894,791 | 2,713,290 | 688,370 |
| එකතුව | 19,000,910 | 19,959,683 | 22,072,256 | 3,465,842 | 16,361,700 | 13,877,271 | 11,899,224 | 5,578,415 |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 453 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු. 632,280 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ව්‍යාපාරික බදු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අක්කර බදු රු. 196,795 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලිපි මගින් අක්කර බදු හිමියන් දැනුවත් කළ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 53 කින් ලැබිය යුතු කඩ කුලී රු. 1,131,868 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්ෂිකව බදුදෙන දේපළ 04 කින් ලැබිය යුතු කුලී රු.608,874 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබු අතර හිඟ වටිනාකම අයනොවූ කාල පරාසය වසර 09 ත් 11 ත් අතර විය. | බදුකරුවන් හා ඇපකරුවන් මියගොස් ඇති නිසා හිඟ මුදල් අයකර ගැනීමට නොහැකි බව. | හිඟ ආදායම් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු 07 කින් ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 192,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 1,363,499 ක් හා රු. 34,976,813 ක් විය. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් නොකිරීම මත සමාලෝචිත හා පෙර වර්ෂයේදී ලද මහජන පැමිණිලි 164 ක් අතුරින් පරික්ෂා කරන ලද පැමිණිලි සංඛ්‍යාව 30 ක් වූ අතර පැමිණිලි පරික්ෂාව සම්බන්ධයෙන් ස්ථාපිත අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි. | මහජන පැමිණිලි ලේඛනය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | මහජන පැමිණිලි ප්‍රමාද නොකර පරික්ෂා කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු.1,850,000 ක් වැයකර කාය වර්ධන මධ්‍යස්ථාන දෙකක් උපකරණ සහිතව ස්ථාපිත කර තිබුණද ඒවා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ක්‍රීඩා සමාජවල සාමාජිකයන් මෙම උපකරණ භාවිතා කරන අතර පැමිණීමේ ලේඛනයක් නඩත්තු කරන මෙන් ක්‍රීඩා සමාජ වලට උපදෙස් දුන් බව. | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 සැප්තැම්බර් මාසයේදී සභාවට භාරදී තිබූ රන්න බටහිර රැස්වීම් ශාලා ගොඩනැගිල්ලේ 01 හා 02 අදියරයන් වලදී වැයකළ මුදල් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකළ අතර 03 වන අදියරේදී පමණක් වැයකළ මුදල රු. 28,913,959 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් රැස්වීම් ශාලාව සභාව විසින් ඵලදායී කාර්යයක යොදවා නොතිබුණි. | නිශ්චිත පැවරීමක් සිදු කරන තෙක් ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා නඩත්තු කිරීම් කළ නොහැකි බැවින් නිශ්චිත කාර්යයක් සඳහා යොදා ගැනීම ගැටලු සහගත බව. | පවරා ගැනීම් සිදු කර වත්කම් ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව භුක්තිවිඳින ඉඩම් හා සුසාන භූමි 47 ක සහ වාහන 05 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා සුසාන භූමි පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් කළ අතර වාහනවල අයිතිය හා ආදායම් බලපත්‍ර ලබාගෙන පවරා ගැනීමට කටයුතු කරන බව. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩාවැල්ල පොළ ගොඩනැගිල්ල සහ ආවරණ දැල්වැට ඉදිකිරීමේ කර්මාන්තය යටතේ PVC දැල්වැට ඉදිකිරීම වෙනුවෙන් රු.162,676 ක් ගෙවීම් කර තිබුණද දැල්වැට ඉදිකිරීමේදී දැල්වැට මත සවිකල යුතු මිලිමීටර 20 x 6 ප්‍රමාණයේ පැතලි යකඩ තහඩුව සවිකර නොතිබියදී සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි. | 20 x 6 ප්‍රමාණයේ පැතලි යකඩ තහඩු යොදා දැල නොගැලවෙන ලෙස සකස් කරන ලෙස කොන්ත්‍රාත් සමිතිය දැනුවත් කළ බව. | ඇස්තමේන්තුව ප්‍රකාරව වැඩ නිම කර තිබිය යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ සේවකයන් 09 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැරව වෙනත් රාජකාරි වල නිරත වී තිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | සේවකයන් අනුමත රාජකාරී වල යෙදවිය යුතුය. |
| (ආ) | 2005 වර්ෂයේදී සේවය හැර ගොස් සිටි සේවකයකුගෙන් ලැබිය යුතු උත්සව අත්තිකාරම් හා ආපදා ණය රු. 90,996 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |